**පොල් වගා කිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල - 2020**

**--------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

පොල් වගා කිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේදී අනාවරණය කරගෙන තිබූ පරිදි අරමුදලේ ලේකම් ලෙස කටයුතු කල පොල් වගා කිරීමේ මණ්ඩලයේ ගණකාධිකාරි විසින් අරමුදලේ සාමාජික නොවන සිය පවුලේ සාමාජිකයන් ඇතුලු 13 දෙනෙකු වෙත ණය, දායක අත්තිකාරම් සහ විශ්‍රාම ප්‍රතිදාන ලෙස චෙක්පත් මගින් මුදල් ලබා දීම තුළින් 2012 වර්ෂයේ සිට වංචා කර තිබූ මුදල 2021 දෙසැම්බර් 31 වන විට රු.77,727,691 ක් වී තිබුණි. 2019 හා 2020 වර්ෂ වලට අදාළ වංචා කළ මුදල වූ රු.26,800,330 ක් ආදායම් වියදම් ගිණුමට ගැලපීම වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාමාජික අරමුදලින් අඩුකර දක්වා තිබුණි. 2012 – 2018 කාලයට අදාළ වංචා කළ රු.46,134,961 ක මුදල සඳහා කිසිදු ගැලපීමක් මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකර නොතිබුණි. | මෙම මුදල වංචාකළ මුදලක් ලෙස අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටු වාර්තාව තුළින් හඳුනාගෙන තිබුණ ද එහි නීති ක්‍රියාමාර්ග තවමත් අවසන් වී නොමැති බැවින් මෙම මුදල නිත්‍ය අලාභයක් ලෙස පාලක සභාව විසින් තහවුරු කොට ගිණුම් වලට ගැලපීම සඳහා හඳුනාගෙන නොමැත. | මණ්ඩලයේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදල් නිවැරදිව හා විධිමත්ව පරිපාලනය කළ යුතු අතර වංචා කළ මුදල් නැවත අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව අරමුදලේ සාමාජික ණය ශේෂය රු.192,009,539 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ණයගැති ලේඛනය හා වයස් විශ්ලේෂණය අනුව එම ශේෂය රු.173,189,645 ක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා ලේඛනය අනුව ශේෂය අතර රු.18,819,894 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම ණය අය කර ගැනීම ගැටලු සහගත බව නිරීක්ෂණය විය. | 2018.12.31 වන දිනට සකස්කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් ණයගැති ශේෂය සඳහා ලේඛනයක් (ණයගැති නාමලේඛනයක්) ඉදිරිපත් කොට නොතිබුණි. 2019 වර්ෂයේ සිට ඉදිරියට අවසන් ගිණුම් සකස් කිරීමේදී ආරම්භක ණයගැති ශේෂය ලෙස යොදා ගනු ලැබුයේ ඉහත 2018 අවසාන ගිණුම්වල ඇතුළත් අවසන් ශේෂය වේ. 2019 වර්ෂයේ සිට වැටුප් ලේඛන අනුව අයකර ගත හැකි සත්‍ය ණයගැති ශේෂය හා ලෙජරය අනුව පවතින ශේෂයන් අතර වෙනස බොල් ණය ලෙස සලකා අලාභයක් ලෙස අරමුදල මහ බැංකුවට පැවරීමේ කමිටුව විසින් සාමාජිකයන් අතර බෙදාහැර අවසන් ශේෂය ගණනය කොට ඇත. | සාමාජික ණය ලේඛනය නිවැරදිව හා යාවත්කාලීනව පවත්වා ගැනීමටත් පවතින වෙනස්කම් නිරවුල් කරගැනීමට හා සියළුම ණය කාලානුරූපීව අයකර ගැනීමටත් විධිමත් පියවර ගත යුතුය. |
| (ඇ) 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අරමුදලේ ණය, අත්තිකාරම් හා ප්‍රදාන ගෙවීම් ගිණුම් මඟින් රු.59,029,104 ක මුදලක් වංචා කර තිබුණු බැවින් හා අරමුදල සඳහා ප්‍රමාණවත් පොත්පත් හා ලේඛන පවත්වා නොතිබීම හේතුවෙන් 2020 | වංචාව අනාවරණය වීමට පෙර 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස්කර තිබූ මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ වංචාව සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව්වක් හෝ අනාවරණයක් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් 2019.01.01 දිනට ලබාගත් | අරමුදල සඳහා ප්‍රමාණවත් නිවැරදි පොත්පත් හා ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතු අතර වංචා කළ මුදල් නොපමාව අයකර |

| | | |
|---|---|---|
| වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල සාමාජික අරමුදලේ සහ සාමාජික ණය ගිණුමේ ආරම්භක ශේෂයන්හි නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | ආරම්භක ශේෂයන් සඳහා පදනම වූයේ පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්ය. වංචාව අනාවරණය වීමෙන් පසු 2019 සිට ඉදිරියට සකස් කළ මූල්‍ය ප්‍රකාශනවල ඒ ඒ වර්ෂය සඳහා හඳුනාගත් වංචාවේ ප්‍රමාණය සටහන් මඟින් ඉදිරිපත් කොට ඇත. විගණනය විසින් පෙන්වාදෙන පරිදි වංචා කළ ගනුදෙනුවල වටිනාකම්ද 2019 ට පෙර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වීම හේතුවෙන් ආරම්භක ශේෂයන් දෝෂ සහිත බව අප විසින් පිළිගෙන ඇත. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | 2018 වර්ෂයේ අවසාන ගිණුම් මත ගෙවිය යුතු ආදායම් බදු සඳහා 2019 වර්ෂයේදී නිකුත් කරන ලද චෙක්පත 2020 වර්සය තුළදී නිෂ්කාශනය වීඹ පමණක් සිදු වී තිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක 102331222 යටතේ එය සිදුකර තිබේ. ඉන් අනතුරුව 2019 වර්ෂයේ සිට ඉහත අංකය යටතේ බදු නොගෙවීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉහත අංකය යටතේම මේ වන විට අප වෙතින් විමසීම් සිදුකර ඇත. | ආදායම් බදු නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) 2018 වර්ෂය සඳහා සේවකයන් දෙදෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු රු.52,890 ක ලාභාංශ, ගෙවිය යුතු ලාභාංශ ලෙස හඳුනා නොගෙන සේවක අර්ථ සාධක අරමුදල් ගිණුමට බැර කිරීම හේතුවෙන් සේවක අර්ථ සාධක අරමුදල් අධිගණනය වී ගෙවිය යුතු ලාභාංශ ඌණ ගණනය වී තිබුණි. | 2021 මාර්තු මස වංචාව අනාවරණය වීමෙන් පසු 2019, 2020 වර්ෂ සඳහා අවසන් ගිණුම් සකස් කරන ලද්දේ 2022 වර්ෂයේදීය. මෙහිදී පැවති මූලාශ්‍ර ලේඛනවල අඩුපාඩු නිසා (අස්ථානගත කර තිබීම) උපචිත පදනමෙන් ගිණුම් සකස් කිරීමට නොහැකි වූ අතර ඉන්පසු මුදල් පදනමට මාරු වී 2019 සිට ඉදිරියට අවසන් ගිණුම් සකස් කරන ලදි. මේ හේතුවෙන් ගෙවිය යුතු ලාභාංශ ගිණුමක සටහන් නොකර ගිණුම්කරණය සිදුකර අවසන් ගිණුම් සකස් කර ඇත. | අරමුදල මඟින් අදාළ සාමාජිකයන්ට ලාභාංශ ගෙවීම හා ගෙවිය යුතු ලාභාංශ ගිණුම්ගත කිරීම විධිමත්ව හා නිවැරදිව සිදුකළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ප්‍රතිදාන ගෙවීම | 343,399 | ගෙවීම් වවුචර්පත් හා උපකාරක ලියවිලි | 2020 වර්ෂයේදී සේවකයන් 64 දෙනෙකුට ප්‍රතිදාන ගෙවා නිදහස් කර තිබූ නමුත් එයට අදාළ මූලාශ්‍ර ලේඛන, වංචාව සිදුකිරීමේ අරමුණින් නිසිලෙස ගොනුගතකර නොතිබූ අතර, මෙම | අරමුදලේ සියළු ගෙවීම් වලට අදාළ වවුචර්පත් හා උපකාරක ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | රු.343,399 ප්‍රතිදාන ගෙවීම්වලට අදාළ සේවකයාගේද තොරතුරු අස්ථානගතකර තිබුණි. එහෙත් වැටුප් ලේඛන හා සාමාජික ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම අරමුදල් ගෙවා ඇති සේවකයාගේ සේවක අංක හා අනෙකුත් තොරතුරු හඳුනාගෙන ඇත. | |
| (ආ) ණය ගෙවීම් | 4,093,386 | ගෙවීම් වවුචර්පත් හා උපකාරක ලියවිලි | 2020 වර්ෂයේ මුදල් පොත, වංචාව සිදුකළ කණ්ඩායම විසින් හිතාමතාම අස්ථානගතකොට ඇත. මේ හේතුවෙන් 2020 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමට පෙර, බැංකු ප්‍රකාශන ආශ්‍රයෙන් නව මුදල් පොතක් සකස් කිරීමට සිදුවිය. එහිදී විගණනය වෙත වවුචර්පත් ඉදිරිපත් නොවුණද මෙම ණය ලබාගත් සේවකයන් නිවැරදිව හඳුනාගෙන ඇත. ඒ අනුව, ඔවුන්ගේ වැටුපෙන් අඩුකිරීම සඳහා වැටුප් ලේඛනවලට ඇතුළත්කොට ඇත. | අරමුදල මඟින් ලබා දී තිබුණු ණයවලට අදාළ වවුචර්පත් හා උපකාරක ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) ණය ගෙවීම් | 24,279,109 | උපකාරක ලියවිලි | 2020 වර්ෂයේ මුදල් පොත, වංචාව සිදුකළ කණ්ඩායම විසින් හිතාමතාම අස්ථානගතකොට ඇත. මේ හේතුවෙන් 2020 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමට පෙර, බැංකු ප්‍රකාශන ආශ්‍රයෙන් නව මුදල් පොතක් සකස් කිරීමට සිදුවිය. එහිදී විගණනය වෙත වවුචර්පත් ඉදිරිපත් නොවුණද මෙම ණය ලබාගත් සේවකයන් නිවැරදිව හඳුනාගෙන ඇත. ඒ අනුව, ඔවුන්ගේ වැටුපෙන් අඩුකිරීම සඳහා වැටුප් ලේඛනවලට ඇතුළත්කොට ඇත. | අරමුදල මඟින් ලබා දී තිබුණු ණයවලට අදාළ උපකාරක ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 27 (3) වගන්තිය හා 1973 මැයි 02 දින | අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් පාලනය කෙරෙන ව්‍යවස්ථා හෝ නියෝග කොමසාරිස්වරයාගේ ලිපිගත අනුමැතිය ඇතිව මිස වෙනස් නොකළ යුතු අතර අරමුදලේ | පොල් වගාකිරීමේ මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල පිහිටි වූ වර්ෂයේ සිට 2021 මාර්තු මස වංචාව අනාවරණය වන තෙක් මෙවැනි ගැටළු සහගත තත්ත්වයන් හෙළිදරව් | අරමුදලේ ව්‍යවස්ථාවට අනුකූලව සියළුම ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| කම්කරු දෙපාර්තමේන්තු වෙන් අනුමත කරන ලද පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් ව්‍යවස්ථාවේ 6 (II) වගන්තිය | පාලනය පිළිබඳ, නියෝගයක් පනවා නොමැති කිසියම් කරුණක් හෝ දෙයක් සම්බන්ධයෙන් ද වූ සියලු කරුණු ගැන පාලන කාරක සභාවේ වැඩි දෙනාගේ තීරණයට, කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ ආවරණ අනුමැතිය ලබාගැනීමෙන් පසුව, ඒ අනුව ක්‍රියා කළ යුතු වුවද 2008 ජුනි 19 දින පැවැත්වූ පාලන කාරක සභාව විසින් සාමාජිකයන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසු එක් වරක්ද, ඊට අවුරුදු 2 ½ කට පසු එනම් වයස අවුරුදු 57 1 ½ සම්පූර්ණ වූ විට නැවත වරක්ද වශයෙන් අවස්ථා දෙකකදී අත්තිකාරම් ගෙවීමට ගන්නා ලද තීරණය සඳහා කම්කරු කොමසාරිස්වරයාගේ හා දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ ආවරණ අනුමැතිය ලබාගැනීමෙන් තොරව හා ව්‍යවස්ථා සංශෝදනයකින් තොරව ක්‍රියාත්මක කර ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 12 දෙනෙකු වෙත රු.10,790,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි. | වී නොතිබුණි. වංචාව අනාවරණය වීමෙන් අනතුරුව මේ පිළිබඳව විධිමත් පරීක්ෂණ හා විගණන ක්‍රියාවලියක් සිදුවීමෙන් අනතුරුව මෙම දෝෂ සහිත සිද්ධීන් සියල්ල අනාවරණය වේ. මෙම අරමුදල මේ දක්වා මෙහෙය වූ පාලක කාරකසභා සාමාජිකයන් මේ වන විට ආයතනය තුළ සේවයේ නොමැති අතර, අනිකුත් සාමාජිකයන් මෙම වංචාවට චෝදනා ලැබූ අය වේ. වත්මන් පාලක කාරකසභාව විසින් ගනු ලබන සියලු තීරණ කම්කරු කොමසාරිස්වරයාගේ සෘජු අධීක්ෂණයට යොමු කරන අතර, ඒ සඳහා අනුමැතිය ලැබීමෙන් පසු පමණක් ක්‍රියාත්මක කරනු ඇත. | |
| (ආ)1973 මැයි 02 දින කම්කරු දෙපාර්තමේන්තු වෙන් අනුමත කරන ලද පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් ව්‍යවස්ථාව | | | |
| (i) 5 වගන්තිය | අරමුදල් සම්බන්ධ කටයුතු තිදෙනෙකුගෙන් යුතු පාලන කාරක සභාවක් විසින් පාලනය කළ යුතු අතර පාලන කාරක සභා රැස්වීමක් සඳහා සනපූර්ණය දෙදෙනෙකු විය යුතුය. එසේ වුවද 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මෙම පාලන කාරක සභාව රැස්වී නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව එම වර්ෂවලදී ගෙවන ලද විශ්‍රාම ප්‍රදාන ණය හා අත්තිකාරම් සඳහා පාලන | 2021 වංචාව හෙළිදරව් වීමෙන් පසු පත්කරනු ලැබූ පාලක කාරකසභාව විසින් කාරකසභා රැස්වීම් පැවැත්වීම, ඒ සඳහා වාර්තා ලිවීම සහ ප්‍රතිදාන හා අත්තිකාරම් නිදහස් කිරීම කාරකසභා අනුමැතිය යටතේ විධිමත් පරිදි සිදු කර ඇත. | රැස්වීම් පැවැත්වීම, විශ්‍රාම ප්‍රදාන, ණය හා අත්තිකාරම් ගෙවීම අරමුදලේ ව්‍යවස්ථාවට අනුකූලව සිදුවිය යුතු අතර රැස්වීම් වාර්තා විධිමත්ව පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාරක සභාවේ අනුමැතිය ලබා දී නොතිබුණි. | | |
| (ii) 28 වගන්තිය | සෑම ලිත් වර්ෂයක් සඳහා සූදානම් කළයුතු අරමුදලේ ගිණුම්, කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබූ විගණකවරයෙකු විසින් සෑම දොළොස් මසකට වරක් බැගින් විගණනය කළ යුතු වුවද 2020 වර්ෂය දක්වා අරමුදලේ ගිණුම් විගණනය කිරීමේ ආයතන පත් කිරීම සඳහා කම්කරු කොමසාරිස් වෙතින් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | වංචාවට පෙර කාලපරිච්ඡේදයේ පාලක කාරකසභාව විසින් අවසන් ගිණුම් විගණනය සඳහා විගණකයෙකු තෝරා පත්කර ගැනීම කටයුතු ප්‍රසම්පාදකර ඇති නමුත්, වංචාවෙන් පසු අවසන් ගිණුම් විගණනය කම්කරු කොමසාරිස්වරයාගේ දැනුවත් කිරීම මත, රජයේ විගණන කාර්යාලය මඟින් පමණක් සිදුකරනු ඇත. | යොමුගත ව්‍යවස්ථාවේ වගන්ති ප්‍රකාරව අරමුදලේ ගිණුම් කම්කරු කොමසාරිස් විසින් අනුමත කළ විගණකයකු ලවා විගණනය කරවා ගත යුතුය. |
| (iii) 29 වගන්තිය | කාරක සභාව විසින් සෑම ලිත් වර්ෂයකදීම එක්වරක් සාමාජිකයන්ගේ රැස්වීමක් කැඳවිය යුතු වුවද අරමුදල විසින් 2019, 2020 හා 2021 වර්ෂයන් සඳහා සාමාජිකයන්ගේ රැස්වීම් පවත්වා නොතිබුණි. | වංචාව හෙළිදරව් වීමෙන් පසු නව පාලක කාරකසභාව විසින් 2022වර්ෂයේ සිට මේ දක්වා අඛණ්ඩව වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීමට කටයුතුකර ඇත. | අරමුදලේ ව්‍යවස්ථාවට අනුකූලව සාමාජික රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.46,180,938 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.56,292,647 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,111,709 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළිය රු. 9,526,162 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි වේ.

| විෂය | 2020 වර්ෂය රු. | 2019 වර්ෂය රු. | විචලනය රු. | විචලනය ප්‍රතිශතයක් ලෙස සියයට |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| ස්ථාවර තැන්පතු පොලී ආදායම් | 42,627,814 | 52,153,976 | 9,526,162 | 18 |
| සාමාජික ණය පොලිය | 5,700,588 | 6,202,810 | 502,222 | 8 |
| **වියදම්** | | | | |
| ආයෝජන කළඹ සඳහා කළමනාකරණ ගාස්තු | 1,991,429 | 1,906,422 | 85,007 | 4 |

**2.3 (අ)** අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2018 වර්ෂය දක්වා පුද්ගලික විගණන ආයතන විසින් විගණනය කර තිබූ අතර 2018 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය නොකළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණි. 2022 මාර්තු 26 දින

අරමුදලේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බාධාවක් නොමැති බවට නීතිපතිවරයා විසින් ලබා දෙන ලද පැහැදිලි කිරීම අනුව විගණකාධිපතිවරයා විසින් 2019 වර්ෂයේ සිට අරමුදලේ විගණන කටයුතු සිදු කරනු ලබයි.

**(ආ)සාමාජික අරමුදල විශ්ලේෂණය**

2020 වර්ෂය අවසානයට අරමුදලේ සාමාජිකයන් 706 ක් සිටින අතර සාමාජික අරමුදල් වටිනාකම රු.මිලියන 695 ක් විය. සමාලෝචිත වර්ෂයේ සාමාජික දායකත්වය රු.මිලියන 87 ක් වුවද වර්ෂය තුළදී අත්තිකාරම් හා ප්‍රදාන ලෙස රු. මිලියන 89 ක් ගෙවීම්කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 28 ක ණය සාමාජිකයන් වෙත ලබාදී තිබුණු අතර රු.මිලියන 23 ක ණය ආපසු අයකරගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වංචාව නිසා අරමුදලට සිදු වූ පාඩුව පියවා ගැනීම සඳහා නීතිපති දෙපාර්තුමේන්තුවේ සහාය ඇතිව අදාළ පුද්ගලයන්ට එරෙහිව සිවිල් නඩු පැවරිය යුතු වුවද 2023 දෙසැම්බර් 31 දක්වා එබඳු නඩු පවරා නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද වංචාව සිදු වූ කාලය වූ 2012 සිට 2021 දක්වා අරමුදලේ ගෙවීම් කටයුතු සිදුකිරීම සඳහා චෙක්පත්වල දෙවන අත්සන් තැබූ අරමුදලේ සභාපතිවරු 7ක් හා වැඩ බැලීමේ හා ද්විතීය පදනම මත පත්කර තිබුණු සාමාන්‍යාධිකාරිවරුන් 7 ක් සම්බන්ධයෙන් කිසිදු නීතිමය කටයුත්තක් 2024 ජූලි 31 දින දක්වා සිදු කර නොතිබුණු අතර මුළු වංචාවෙන් රු.15,898,523 ක් පමණක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයකරගෙන තිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදලේ චෙක්පත් මඟින් සිදුව ඇති මූල්‍ය වංචාවට අදාළ අයකර ගැනීම් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයක් ලෙස නීතිපති දෙපාර්තමේන්තුව හරහා ගොනුකරනු ලැබූ නඩු සියල්ල පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් නොව නීතිපති දෙපාර්තමේන්තුව විසින්ම නැවත ගොනු කිරීමේ පදනම මත ඉවත්කර ගැනීම සිදුකර ඇත. අරමුදලේ දෙවන අත්සන්කරුවන් වෙත නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුම් දී ඇත. | වංචාව පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව නීතිමය පියවර කඩිනමින් ගතයුතු අතර වංචා කළ මුදල් අයකර ගැනීමටද නොපමාව කටයුතු කළ යුතුය. |